# වැව් ජලය භාවිතය හා වැව ආරක්ෂා කරගැනීම සම්බන්ධයෙන් ගොඩනැගුණු සමාජ සන්නිවේදනාත්මක පසුබිම

**ආචාර්ය සේන නානායක්කාර**[1]

ග්‍රාමීය කෘෂි සමාජයෙහි මූලිකතම පොදු කේන්ද්‍රස්ථානය වැව යි. සමාජ ආර්ථික හා සංස්කෘතිකමය වශයෙන් ගත් කල ගැමි ජන ජීවිතය හා මෙතරම් ඓන්ද්‍රීය වශයෙන් බද්ධ වූ වෙනත් ආයතනික ව්‍යුහයක් නැති තරම් ය. මන්දයත්, උපතේ සිට මරණය දක්වා ගැමි ජන ජීවිතය හා බැඳෙන සංස්කෘතිකමය බැම්ම ඉන් උපදනා බැවිනි. එබැවින්, වැව එහි ප්‍රධානතම සංස්කෘතික මූලය ලෙස පිළිගැනිණි. ඒ අනුව එහි භාවිතයත්, රක්ෂණයත් එකල ප්‍රමුඛ සමාජ වගකීමක් ලෙස අවධාරණය විය. මේ අධ්‍යයනයෙන් හෙළිදරව් කිරීමට උත්සාහ කෙරෙනුයේ රජරට පුරාණ කෘෂි ආර්ථිකයෙහි වැව් ජලය භාවිත කිරීමේ දීත්, වැව ආරක්ෂා කරගැනීමේ දීත් ගොඩනැගුණු සමාජ සන්නිවේදනාත්මක පසුබිම යි.

ක්‍රිස්තු පූර්ව පස් වන සියවසෙහි පණ්ඩුකාභය රජු විසින් අනුරාධපුර අභය වැවෙන් අරඹන ලද ලාංකේය වාරි කර්මාන්තය පසුකල බෙහෙවින් බලපෑම් සහගත, පුළුල් සමාජ ක්‍රියාවලියක් බවට පත්විය. සෑම ගමකම වැවක් ගොඩනැගෙමින් වැව් ගම්මාන නිර්මාණය වූයේ ඒ අනුව ය. වැව කේන්ද්‍ර කොට ගැනුණු ගැමි කෘෂි ආර්ථිකය විසින් එය වඩාත් සමීප සංස්කෘතික බැඳීමක් බවට පත් කරන ලදි. ඒ අනුව, ගැමියන්ගේ ජීවනෝපාය වූ වී ගොවිතැනත්, ඒ හා බැඳුණු සමස්ත ජීවන චර්යාවනුත් සම්බන්ධ කෙරුණේ වැවට ය. මුල් බිං හීයේ සිට අස්වනු නෙළීම දක්වා වූ ක්‍රියාකාරිත්වයන් ඊට අදාළ ය.

"වැව් ලේකම්" තනතුර බිහි වූයේ ඒ අනුව ය. ඒ, එහි ජල භාවිතය හා රක්ෂණය පිළිබඳ භාරකාරත්වය උදෙසා ය. "වැව් රාජකාරී" යන්නෙන් සන්නිවේදනය වූයේ ඔහුට අයත් කාර්යභාරයයි. "බෝල බැඳීම" එක් සන්නිවේදන ක්‍රමෝපායයක්

[1] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
Email: *sena@rjt.ac.lk / senananayakkara@yahoo.com*

විය. වැවේ වතුර අපිරිසිදු කිරීම, අනිසි ලෙස භාවිතය හෝ මාළු ඇල්ලීම වැනි දේ තහනම් කිරීමේ දී බැඳෙන "අණ බෝලය" ඊට අදාළ එක් නියමයකි. එය ඇස ගැටෙන ගැමියන් ඊට ප්‍රතිචාර දැක්වූයේ අදාළ සන්නිවේදනාර්ථය පිළිබඳ භාවිත අවබෝධයෙනි. "මුට්ටි නැමිල්ල" වෙනත් කාරියකි. එය ආගමික ස්වරූපයක් ගත් අභිචාරමය ක්‍රියාවලියක් ලෙස වාර්ෂිකව පැවැත්වෙන්නකි. සශ්‍රීකත්වය අපේක්ෂා කරන ගැමියෝ එය ද වැව් රාජකාරියක් සේ සලකති. අභිචාර සන්නිවේදනයන් ලෙස එබඳු සමාජ කාර්යයන් රැසක් වැව් භාවිතයෙහි හා රක්ෂණයෙහි ලා සිදු කෙරුණු බව නිගමනය වෙයි. ඒ අනුව, ඊට අදාළ ව ගොඩනැගුණු සමාජ සන්නිවේදනාත්මක පසුබිම මෙකී අධ්‍යයනයේ දී අවධාරණය කෙරේ.

ප්‍රමුඛ පද: ජනශ්‍රැති සාධක, වැව්ලේකම්, වැව් රාජකාරී, බෝල බැඳීම, අණබෝලය, මුට්ටි නැමිල්ල

**Title:** The Socio Communicational Background built on Usage and Conservation of the Tank

**Keywords:** folklore evidence, tank secretary, tank duties, bola bandima, anabolaya, mutti namilla